www.wsws.org

# ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජවිපෙ -පෙසප "ඉල්මහ විරු සැමරුම" සහ 1987-89 භීෂනය

ඩබ්ලිව්. ඒ. සුනිල් විසිනි

2017 නොවැම්බර් 26

13 වෙනිදා කොලඹ විහාර මහාදේවි එලිමහන් රංග පීඨයේ පැවති රැස්වීමේ දී ජවිපෙ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා මෙසේ පැවසීය. "87, 88, 89 කාලයේ අපේ රටේ නිදහස වෙනුවෙන්, ජනතාවගේ විමුක්තිය වෙනුවෙන්, සමාජවාදය වෙනුවෙන් අපේ සහෝදරවරු කරපු අරගලය තාවකාලික පරාජයක් ලැබුවත් ඒ අරගලය මේ මව්බිමතුල සමාජවාදී සමාජයක් නිර්මානය කිරීමෙන් ජයග්‍රහනය කරනවා."

අම්බලන්ගොඩ කරන්දෙනියේ පෙසප පැවත් වූ රැස්වීමකදී පක්ෂයේ නායක කුමාර් ගුනරත්නම් එයම ප්‍රතිරාවය කරමින් මෙසේ පැවසීය: "1971 සන්නද්ධ නැගිටීමත් 87-89 නැගිටීමත් සමාජවාදය ඉලක්ක කරගත් අරගලයන්."

මෙම ප්‍රකාශ ඇත්ත වසන් කිරීමේ දැනුවත් උත්සාහයකි. 1971 හෝ 1987-1989 ජවිපෙ සන්නද්ධ ව්‍යාපාරයන් කිසිසේත් ම සමාජවාදය සඳහා අරගලයන් නොවේ. 1971 ජවිපෙ සිදුකල නැගිටීම සුලුධනේශ්වර කැරැල්ලකි. 1987-1989 සන්නද්ධ ව්‍යාපාරය දෙමල විරෝධී වර්ගවාදය අවුස්සමින් කම්කරුවන් හා දුගීන් අතර වර්ධනය වෙමින් පැවති පෙරලිකාරිත්වය රට යට කිරීමට ෆැසිස්ට් විධික්‍රම යොදා ගනිමින් ගෙනගිය භීෂනයකි.

ජවිපෙ සහ පෙසප ස්වයං-විවේචන කිරීමට ද ඒවා යලි ගිල ගැනීමටද ඉතා දක්ෂය. 2015 මහා මැතිවරනය සඳහා ජවිපෙ නිකුත් කල ප්‍රකාශය මහා ව්‍යාපාරිකයන්ට ඉදිරිපත් කරමින් පක්ෂයේ නායක අනුර කුමාර දිසානායක 1971 සහ 1987-1989 කැරලි ගැන මෙසේ කීවේය: "පක්ෂයක් විසින් නො කලයුතු සමහර ක්‍රියාවන් අපි කලෙමු. අපි ඒවා ගැන කනගාටු වෙමු. අපි යලිත් ආයුධ ගෙන සටන් නොකරන්නෙමු. අපගේ අරගලය මතවාදී එකක් වනු ඇත." එදා සමාජවාදය සඳහා අරගලය කලේ යයි දැන් මැත දොඩවන්නේ එසේ ප්‍රකාශ කල ජවිපෙ නායකයන්ම ය.

අසූව දසකයේ මැද භාගයේ ලංකාවේ පාලක පන්තිය, එක් පැත්තකින් බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහි යුද්ධයේ පැටලී සිටි අතර අනෙක් පැත්තෙන් ජනාධිපති ජේ. ආර්. ජයවර්ධනගේ ආන්ඩුව ජීවන තත්වයන්ට හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කල ප්‍රහාරවලට විරුද්ධව කම්කරු පන්තියේ සහ ගම්බද දුගී ගොවීන්ගේ බරපතල විරුද්ධත්වයකට මුහුන දී සිටියේ ය.

නව දිල්ලි ආන්ඩුව 1987 ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කිරීමට ජයවර්ධන තල්ලු කරගනිමින් ලක්ෂයක් ඉන්දියානු "සාම සාධක" හමුදා දිවයිනේ උතුරු-නැගෙනහිරට එවන ලද්දේ කොලඹ ආන්ඩුව අස්ථාවර වීම නතරකර ගැනීමට හා ඉන්දියාව තුල විශේෂයෙන් තමිල් නාඩුවේ යුද්ධය නිසා ඇතිවූ විරෝධය යටපත් කර ගැනීමටයි. ගිවිසුමෙන් දෙමල ප්‍රභූවට යම් වරප්‍රසාද ලබා දී සැලසුමට නමා ගැනීමටත් එල්ටීටීඊය නිරායුධ කිරීමටත් ඉන්දීය ආන්ඩුවට අවශ්‍ය විය. ජයවර්ධන උතුර හා නැගෙනහිර ප්‍රදේශයෙන් ගෙන්වා ගත් මිලිටරිය කම්කරුවන්ට හා දුගීන්ට එරෙහිව මුදා හැරියේය. කම්කරුවන් හා දුගීන් මුහුන දුන්නේ එලෙස මුදාහැරුන රුදුරු රාජ්‍ය ත්‍රස්තයට හා ජවිපෙ විසින් දියත් කෙරුනු සන්නද්ධ ත්‍රස්ත ව්‍යාපාරයටයි.

ඊනියා දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය නමින් හැඳින් වූ ජවිපෙ සන්නද්ධ ව්‍යාපාරය ඉස්මත්තට ආයේ ඉන්දු ලංකා ගිවිසුම මගින් යෝජිත පලාත් සභා මගින් රට බෙදන බවට චෝදනා කරමින් දෙමල විරෝධී වර්ගවාදය උසිගන්වන දක්ෂිනාංශික ව්‍යාපාරයක් ලෙසය. එජාපයේ ආර්. ප්‍රේමදාස කල්ලියේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප), වර්ගවාදී මහජන එක්සත් පෙරමුනේ හා සිංහල බෞද්ධ අන්තවාදීන්ගේ අනුග්‍රහය එයට ලැබුනි.

ඇතැම් වාර්තාවලට අනුව ජවිපෙ තුවක්කුකරුවන් විසින් ඝාතනය කෙරුන සංඛ්‍යාව 7,000 ට ආසන්නය. ඉන් බහුතරය ජවිපෙ දේශපාලන විරුද්ධවාදීන්, කම්කරුවන්, වෘත්තීය සමිති ක්‍රියාකාරීන්, කලාකරුවන් හා මාධ්‍යවේදීන් ය. සමාජවාදී සමානතා පක්ෂයේ පෙර ගමන්කරු වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ (විකොස) සාමජිකයන් තිදෙනෙක් ද ජවිපෙ විසින් ඝාතනය කෙරුනි.

1988 ජනාධිපති වූ යුඇන්පී නායක රනසිංහ ප්‍රේමදාස පලමුව ජවිපෙ නායක රෝහන විජේවීර සමග රහස් සාකච්ඡා පවත්වමින් සම්මුතියකට දක්කා ගැනීමට තැත් කලේය. එහෙත් පාලක කොටස්වල හා මිලිටරි නායකයන්ගේ විරුද්ධත්වය මධ්‍යයේ ආපසු හැරුනු ප්‍රේමදාස ආන්ඩුව

විජේවීර ඇතුලු පක්ෂ නායකයන් හා බහුතරයක් පක්ෂ සාමාජිකයන් ද පෙරලිකාරීව සිටි තරුනයන් වෙසයින්ම ගම්බද තරුනයන් 6 0,000ක් පමන ඝාතනය කෙරුන භීෂනයට මිලිටරිය මුදා හලේය.

රාජ්‍ය මර්දනයට, ජවිපෙ ත්‍රස්ත ව්‍යාපාරයට හා දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයේ බෙදුම්වාදයට විරුද්ධව සිංහල, දෙමල හා මුස්ලිම් කම්කරු පන්තිය ජාත්‍යන්තර සමාජවාදී ඉදිරිදර්ශනය මත එකමුතු කිරීම සඳහා දෘඪතර අරගලයක යෙදුන විකොස 1989 විජේවීර ඇතුලු ජවිපෙ නායකයන්, සාමාජිකයන් හා ගම්බද දුගීන් තලා දැමුනු රාජ්‍ය මර්දනයට එරෙහිව සප්‍රතිපත්තික අරගලයක් ගෙන ගියේ ය.

සිය නායකයා වූ රෝහන විජේවීර ඇතුලු නායකත්වයේ හා සාමාජිකත්වයේ බහුතරයක් මරා දැමූ ධනේශ්වර පාලකයන් හා මිලිටරිය කෙරහි ජවිපෙට ඇත්තේ මිත්‍රශීලී සම්බන්ධයකි. 1987-1989 ඝාතනයන් ට වගකිවයුත්තන් කවුරු වුනත් ඔවුන් සමග කිසිදු "පෞද්ගලික අමනාපයක් නැති බව" ජවිපෙ දේශපාලන මන්ඩල සභික කේ.ඩී. ලාල්කාන්ත පැවසුවේ ය. මෙම නරුම ප්‍රකාශ පෙන්නුම් කරන්නේ ධනේශ්වර දේශපාලන සංස්ථාපිතයට ජවිපෙ කෙතරම් තදින් ගැටගැසී සිටින්නේ දැයි පෙන්නුම් කරමිනි.

එපමනක් නොව; මහින්ද රාජපක්ෂ ආන්ඩුව යටතේ 2006 යලි යුද්ධය ආරම්භ කෙරුනු පසු හමුදා බුද්ධි අංශ සමග සම්බන්ධතා ගොඩ නගාගත් ජවිපෙ හමුදාවට බංකර් කැපීම සඳහා එහි සාමාජිකයන් මෙහය විය.

සමාජවාදය ගැන සටන් පාඨ විටින්විට ඇද බාමින් රතු රෙද්දෙන් පොරවා ගැනීම ජවිපෙ කරයි. එහෙත් එය ආරම්භ කෙරුනේම ස්ටැලින්වාදය, මාඕවාදය හා ගුවේරාවාදය සිංහල වර්ගවාදය සමග කලතා ගත් දෘෂ්ටිවාදයක් මත පදනම් වෙමිනි. 1971 කැරැල්ලට සිරගතව සිට 1978 නිදහස්වීමෙන් පසුව කල ඊනියා ස්වයං විවේචනයේ දී ජවිපෙ උපත ලැබුවේ "මෙන්ෂෙවික් ගර්භාෂයෙන්" බව විජේවීර ලියා ඇත. මෙන්ෂෙවික්වාදය යනු ලෙනින් ගේ බෝල්ශෙවික් පක්ෂය විසින් වර්ධනය කල ජාත්‍යන්තර සමාජවාදී ඉදිරිදර්ශනයට විරුද්ධව අවධි දෙකේ විප්ලවයේ ප්‍රතිගාමී හා ජාතිකවාදී ඉදිරිදර්ශනය ඉදිරිපත්කල රුසියාවේ අවස්ථාවාදී දේශපාලන කන්ඩායමයි.

නිෂ්පාදනයේ ගෝලීයකරනය තුල ස්ටැලින්වාදයේ බිඳවැටීමත්, ජාතිකවාදයේ බංකොලොත්කම සහ පරිහානියත් තුල ජවිපෙ වඩ වඩා දකුනට තල්ලු විය.

පසුගිය දසක දෙක තුල ජවිපෙ ඍජුව හෝ වක්‍රව ශ්‍රීලනිප හා එජාප ආන්ඩු බලයට ගෙන ඒමට දරදිය අදිමින් ශ්‍රී ලංකාවේ ධනපති පන්ති පාලනය මුහුන දුන් අතිශය බරපතල දේශපාලන අස්ථාවරත්වයෙන් එය රැක ගැනීමේ ද වර්ගවාදී යුද්ධය හා පන්ති අරගල මැඩීම සඳහා එහි අත ශක්තිමත් කිරීමේ ද අනවරත උත්සාහයක යෙදී සිටියේ ය.

1993 එජාප ආන්ඩුව බිඳ දමමින් තීව්‍ර වුන ලංකාවේ දේශපාලන අර්බුදය මධ්‍යයේ කම්කරු පන්තිය හා ගම්බද තරුනයන් දේශපාලනිකව අවමංගත කිරීම සඳහා එය යලි සේවයට කැඳවා ගැනීමට එවක ජනාධිපති ඩී.බී. විජේතුංග සහ චන්ද්‍රිකා කුමාරතුංග ඇතුලු පාලක පන්තියේ කොටසක් තීන්දු කලේය. ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුනෙන් 1994 මහ මැතිවරනයට ඉදිරිපත් වූ ජවිපෙ එම වසරේම ජනාධිපතිවරනයේ දී විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ ව්‍යාජ පොරොන්දුව මත කුමාරතුංග සමග නිතරග ගිවිසුමකට එලඹුනේය.

2001 දී කුමාරතුංග සමග පරිවාස ආන්ඩුවකට ඇතුලු වූ ජවිපෙ 2004 දී ශ්‍රීලනිපය සමග සන්ධාන ගත වෙමින් ඇයගේ එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුවට ගාල් වී එහි ඇමතිකම් තුනක් භාර ගත්තේය.

2004 දෙසැම්බර් මාසයේ සුනාමියෙන් අවතැන් වූ උතුරු නැගෙනහිර දෙමල ජනයාට කිසිදු සහනයක් දීමට විරුද්ධව කුමාරතුංග ගේ ආන්ඩුවෙන් දොට්ට බැස්ස ජවිපෙ 2005 රාජපක්ෂ බලයට ගෙන ඒමට සහයෝගය දුන් අතර වර්ගවාදී යුද්ධයේ කසකරුවෙක් ලෙස ක්‍රියාත්මක විය.

ජවිපෙ මේ කුප්‍රකට වාර්තාව ටිල්වින් සිල්වා රැස්වීම තුල දී මෙලෙස තලු මැරුවේ ය: "සන්ධානයක් ගහල (2004 ශ්‍රීලනිපය සමග සන්ධානය) යූඇන්පී ආන්ඩුව පෙරලුවේ රට බෙදන එක වලක් වන්න."... "අපි ආන්ඩුවෙන් එලියට ඇවිල්ල උසාවියට ගිහිල්ල සුනාමි සහන මන්ඩලය පැරද්දුව".... "උතුරු නැගෙනහිර පලාත් දෙක වෙන් කලේ ජනතා විමුක්ති පෙරමුන ශ්‍රේෂ්ඨාධිකරනයට ගිහිල්ලයි."

2005 ජනාධිපතිවරනයේදී "මව්බිම රැක ගැනීමේ" ප්‍රතිගාමී උද්ඝෝෂනය පෙරට දමමින් රාජපක්ෂ බලයට ගෙන ඒමට කැපවූ ජවිපෙ ඔහු යුද්ධය අවිලවූ පසුව පැන නැගුනු කම්කරු අරගල කොටින්ට සහයෝගය දෙන ක්‍රියා ලෙස හංවඩු ගසමින් රාජ්‍ය මර්දනය ඒවා මතට කඩාපාත් කිරීමට සහයෝගය දුන්නේ ය. 2010 දී ජනාධිපතිවරනයේදී ජවිපෙ තවත් කරනමකින් දරදිය ඇද්දේ එජාපය සමග එක්ව පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වූ හිටපු හමුදා නායක සරත් ෆොන්සේකා දිනවීමටයි.

2015 ජනාධිපතිවරනයේ දී රාජපක්ෂගේ

ඒකාධිපතිත්වයෙන් රට මුදා ගැනීමේ හා ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමේ නමින් මෛත්‍රීපාල සිරිසේන බලයට ගෙන ඒමට කැපවිය. ජවිපෙ එලෙස පෙල ගැසුනේ රාජපක්ෂ තන්ත්‍රය චීනය සමග පැවති සමීප සම්බන්ධතා කලාපය තුල සිය මුලෝපායික ආසක්තයන්ට බාධාවක් ලෙස සැලකූ එක්සත් ජනපද අධිරාජ්‍යවාදය විසින් ඉන්දියාවේ ද සහායෙන් ක්‍රියාවට දැමූ තන්ත්‍ර මාරුව සමගයි.

ධනේශ්වර ඒකීය රාජ්‍යය ආරක්ෂා කිරීම කෙරෙහි ජවිපෙ කැපවීම යලි අවධාරනය කරමින් සිල්වා එම සමරු රැස්වීමේදී මෙසේ කීවේය: "අපි රට බෙදන්නත් විරුද්ධයි, ඒවගේම බලහත්කාරයෙන් යටත් කරගෙන ඉන්නත් විරුද්ධයි. ඒ කියන්නේ මධ්‍යගත රාජ්‍යයක් අපට ඕනා". මධ්‍යගත රාජ්‍යයක් යනුවෙන් ජවිපෙ අදහස් කරන්නේ සිංහල ස්වෝත්තමවාදී දක්ෂිනාංශික බලවේග විසින් ඉල්ලා සිටින බුද්ධාගමට ප්‍රමුඛත්වය දෙන සිංහල අධිපතිවාදී ඒකීය රාජ්‍යයකි.

ජවිපෙ මෙන් ම පෙසප ද 1987-1989 වර්ගවාදී ව්‍යාපාරය සමාජවාදය සඳහා අරගලයක් ලෙස තම රැස්වීම් වලදී ඔප නැංවූ අතර එය ඉන්දියානු ආක්‍රමනයට, ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනයට හා ජේ. ආර්. ජයවර්ධන ආන්ඩුව විසින් ක්‍රියාවට දැමූ කොල්ලකාරී ආර්ථික ක්‍රමයට එරෙහි අරගලයක් ලෙස හුවා දැක් වී ය.

"ඉන්දියානු හමුදාව ලංකාවට ආපු වෙලාවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනයට හා කොල්ලකාරී ආර්ථිකයට තීරනාත්මක පරාජයක් අත්කරදීම සඳහා දේශප්‍රේමී ව්‍යාපාරය සන්නද්ධ අරගලයක් ආරම්භ කල"බව කරන්දෙනියේ පැවති රැස්වීමේදී ගුනරත්නම් ප්‍රකාශ කලේ ය.

ජවිපෙන් කැඩී තමන් වෙනම පක්ෂයක් හැදුවේ එහි "සහාග දේශපාලනයට" හා "වර්ගවාදයට" හා යුද්ධයට සහයෝගය දීමට විරුද්ධව බව 1978-2012 ජවිපෙ ගමන් මග නමින් පලකර ඇති "ස්වයං විවේචනය" තුල පෙසප ප්‍රකාශ කර ඇත. මෙම ප්‍රකාශවලින් තහවුරු කර ඇත්තේ එම ස්වයං විවේචනය අමු මුසාවක් බවයි.

පෙසප නායකයන් 2011 ජවිපෙන් කැඩුනේ එය යුද්ධයට සහයෝගය දීමෙන් හා කම්කරු-පීඩිත ජනයාගේ ජීවන තත්වයන්ට සහ ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කල ප්‍රහාරවල දී ධනේශ්වර රාජ්‍යයේ අත්ගෙඩියක් ලෙස වැඩ කිරීම මගින් මහජනතාව තුල අපකීර්තියට පත් වූ තත්වය තුල මහ ජනතාවට එරෙහිව නව දේශපාලන උගුලක් ඇටවීමට බව සමාජවාදී සමානතා පක්ෂය අවධාරනය කලේ ය. ගත වූ වසර කිහිපය තුල පෙසප ක්‍රියාකාරිත්වය විසින් එය සනාත කර ඇත.

විප්ලවය හා සමාජවාදය ගැන ද ප්‍රකාශ දෙන පෙසප සමාජවාදයට හතුරු ව්‍යාජ වාම පක්ෂයකි. රාජපක්ෂ ගේ ආඥාදායක පාලනය පරාජය කිරීමේ නමින් වර්තමාන සම්මුති ආන්ඩුව බලයට ගෙන ඒමට පෙසප වක්‍රව සහාය දැක්වූයේය. ආන්ඩුවේ ප්‍රහාරවලට විරුද්ධ මතු වූ කම්කරු-පීඩිත ජනයාගේ අරගල දේශපාලනිකව අවමංගත කිරීම සඳහා ඊනියා සිවිල් සංවිධාන, වෘත්තීය සමිති හා එක්සත් සමාජවාදී පක්ෂය (එසප) වැනි සෙසු ව්‍යාජ වාම කල්ලි සමග එය එකතු විය.

ග්‍රීසියේ සිරිසා සහ ස්පාඤ්ඤයේ පොඩෙමොස් ව්‍යාපාරය ඇතුලු ව්‍යාජ වාම ව්‍යාපාර සමාජවාදය සඳහා සටන් කරන ව්‍යාපාර ලෙස හුවා දක්වමින් කම්කරුවන් සහ තරුනයන් මුලා කරන පෙසප ධනපති ආන්ඩුවේ ප්‍රහාරවලට එරෙහිව කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් මතුවීම වැලක් වීමට දැනුවත්ව ම වැඩ කරයි.

නිදහස් අධ්‍යාපනය පුද්ගලීකරනයට එරෙහි ශිෂ්‍යයන්ගේ සයිටම් පුද්ගලික වෛද්‍ය විද්‍යාලයට විරුද්ධ අරගලය තුල දී පෙසපහි විනාශකාරී දේශපාලනය මැනවින් ප්‍රදර්ශනය විය. සයිටම් විරෝධී ජනපවුර නමින් ජවිපෙ, රාජපක්ෂගේ ඒකාබද්ධ විපක්ෂය හා වෘත්තීය සමිති සමග පෙල ගැසුන පෙසප සහ එය විසින් පාලනය කරන අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලය (අවිශිබම) අවුරුද්දකට ආසන්න කාලයක් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් මහ මග රස්තියාදු කිරීමෙන් හා රාජ්‍ය මර්දනයට ගොදුරු කිරීමෙන් පසු සයිටම් අහෝසි කරන බවට ආන්ඩුව දුන් බොරු පොරොන්දුව පිලිගෙන නොවැම්බර් 9 වෙනිදා සිසු අරගලය පාවා දුන්නේ ය.

සමස්ත ධනේශ්වර දේශපාලන සංස්ථාපිතයම අපකීර්තියට පත් ව දේශපාලන අර්බුදයක ගිලී යන තතු තුල කම්කරු පන්තියට එරෙහි දක්ෂිනාංශික ව්‍යාපාරයක් ඉස්මත්තට ගැනීමට ජවිපෙ වෙර දරන අතර පෙසප උත්සාහ කරන්නේ ස්පාඤ්ඤයේ හා ග්‍රීසියේ සිරිසා හා පොඩෙමොස් වැනි ව්‍යාජ වාම ව්‍යාපාරයකට කම්කරුවන් හා තරුනයන් කොටු කර ධනේශ්වර

© www.wsws.org